# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2391/36 – 2024 ජූලි මස 06 වැනි සෙනසුරාදා – 2024.07.06**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2022/69.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාලඹේ, වැව පාර, අංක 289/8 හි පදිංචි ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය සහ අතුරුගිරිය, එම්. ඩී. එච්. ජයවර්ධන මාවත පිහිටි ජාතික වැවිලි කළමනාකරණ ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A86/2023 හා 2024.05.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුනි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 042168 – 18 (2024/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ

*යොමු අංකය:* A/86/2023.
IR/COM/01/2022/69.

ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය,
අංක 289/8,
වැව පාර,
මාලඹේ.

*පළමු පාර්ශ්වය*

පලමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටිම.

ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය
නීතිඥ කේ. පී. කුමාරසිංහ මහතා
කේ. ජී. නේපාල මහතා

*එදිරිව*

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය,
එම්. ඩී. එච්. ජයවර්ධන මාවත,
අතුරුගිරිය.

*දෙවන පාර්ශ්වය*

දෙවන පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටිම.

ප්‍රධාන විධායක/අධ්‍යක්ෂ ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා,
පරිපාලන නිලධාරි, සහකාර අධ්‍යක්ෂක (වැ.බ.)
එම්. සී. ආර්. ජයන්ත මහතා,
නීතිඥ රුවන් දයාසිංහ මහතා

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඒ. බී. හේරත් වන මා බේරුම්කරු වශයෙන් පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට තුඩුදුන් කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව පහත සඳහන් දෙපාර්ශ්වය අතර, උද්ගතවී ඇති කාර්මික ආරාවුලයි.

මෙම ආරාවුලට හේතු වී ඇති කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් නීතිඥ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා විසින් නිකුත් කරන ලද ඔහුගේ අංක IR/COM/01/2022/69 හා 2023.11.23 දින ලිපිය අනුව "ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) ලෙස සේවය කළ ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මහත්මිය 2019.03.25 දින සිට බලපැවැත්වෙන පරිදි රැකියාවෙන් ඉවත් කිරීමේ දී ආයතනය අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙල මගින් ආසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ ආසාධාරණයක් සිදු ව තිබේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳ වේ."

**බේරුම්කරණ විභාගයේ පසුබිම හා එය පැවැත්වූ ආකාරය**

මෙම බේරුම්කරණයට අදාළ ඇතැම් ලේඛන ඔප්පු කිරීමේ භාරයට යටත් ව පළමු හා දෙවන පාර්ශ්වයෙන් ඉදිරිපත් කළ ඇතැම් ලේඛන හා නීති තර්ක හමුවේ පවත්වාගෙන ගිය බේරුම්කරණයක් බව සඳහන් කරමි.

එම බේරුම්කරණය මා වෙත දැනුම් දී ඇති පරිදි කළට වේලාවට අවසන් කිරීමේ අවශ්‍යතාවය දෙපාර්ශ්වයටම ආරම්භක දිනයේ දීම පැහැදිලි කර දුන් අතර ඒ සඳහා අවශ්‍ය සහයෝගය මා වෙත ලබා දීමට කටයුතු කරන ලෙසට ද දැනුවත් කරන ලදී.

පහත සඳහන් දිනයන් යටතේ නඩු අංක A/86/2023 යටතේ පහත සඳහන් දිනයන් හි දෙපාර්ශ්වයම කාර්මික අධිකරණයට කැඳවා නඩුව විභාග කිරීමට කටයුතු කර ඇත.

2023.12.19
2024.01.04
2024.01.11
2024.01.17
2024.01.30
2024.02.06
2024.02.13
2024.02.27
2024.03.06
2024.03.25
2024.04.09 (ලි.දේ.)

මෙම නඩුවේ ඉල්ලුම්කාරිය වන ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂක (පාලන) තනතුර සඳහා විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් පසුව අදාළ අනුමත ක්‍රියා පටිපාටිවලට අනුව 2018.03.21 දින සිට උක්ත තනතුර සඳහා බඳවා ගත් බව ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂක හා ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා විසින් අත්සන් කරන ලද ඔහුගේ අංක NIPM/04/01/PF-275/2023-1

හා 2023.12.15 ලිපියෙන් කාර්මික අධිකරණය වෙත දැනුම් දී ඇත. (පිටු අංක 21)

මෙසේ රැකියාවට බඳවාගත් ඉල්ලුම්කාරිය 2019.03.25 සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ තනතුරින් ඉවත් කිරීම තුළින් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදු වී ඇති බවට ප්‍රකාශ කර සිටී. ඇයගේ උක්ත රැකියාවේ පරිවාස කාළ සීමාව වර්ෂ 03ක් වන අතර ඇය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වසරක පරිවාස කාලයක සේවය කිරීමෙන් පසු මෙසේ ඉවත් කිරීමට කටයුතු කළ බව පාලක මණ්ඩල පත්‍රිකා 336/17 අනුව පැහැදිලි වේ. (පිටු අංක 756 - 757) එහි වැඩිදුරටත් සඳහන් වන්නේ "ඇයට රාජකාරීමය වශයෙන් පවතින දුර්වලතා හා අකාර්යක්ෂමතා නිවැරදි කර ගැනීම සඳහා දින 90 ක කාලයක් ලබා දී තිබුණද ඇයගේ රාජකාරී කටයුතු වල කිසිදු සැලකිය යුතු අන්දමේ ප්‍රගතියක් නොමැති බව අධ්‍යක්ෂක ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා විසින් පාලක මණ්ඩලයට දැනුම් දෙන ලදි යනුවෙනි." ඒ අනුව 336 වෙනි පාලක මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව ඉල්ලුම්කාරියගේ සේවය සමාප්ත කළ බවයි. (පිටු අංක 756-R7)(පිටු අංක 162,163)

එමෙන්ම මෙම ආයතනයේ සහාකාර අධ්‍යක්ෂ (පාලන) ධුරයෙන් ඉවත්ව යාම සඳහා අයැද සිටි යොමු අංක NIPM/04/02/07 දරන 2018.12.28 දිනැති හා NIPM/04/04/01/BOG/2018/32 දරන 2019.01.22 දිනැති අභ්‍යන්තර මැමයන් හි අන්තර්ගතයන් හා ඇය වෙත නිකුත් කොට ඇති පත්වීම් ලිපිය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් හා විශ්ලේෂණයකින් පසුව පත්වීම් ලිපිය හා බැඳුණු යුතුකම්, රාජකාරි හා හැසිරීම් ඇය විසින් නොපිරිහෙලා ඉටුකර නොමැති බව තීරණය කිරීමෙන් අනතුරුව රැකියාවේ පරිවාස කාලය තුළ සිටින ඇයගේ සේවය දින 30 ක පූර්ව දැනුම් දීමකින් පසුව අවසන් කොට ඇය රැකියාවෙන් මුදා හැර ඇයගේ සේවය සමාප්ත කිරීමට පාලක මණ්ඩල සාමාජිකයන් ඒකමතිකව තීරණය කරන ලදී." (පිටු අංක 757)

ඉල්ලුම්කාරිය සිය පළමු ලිඛිත දේශනය ඉදිපත් කරමින් කියා සිටියේ මෙසේ රැකියාවෙන් ඉවත් කිරීමට ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙල මගින් අසාධාරණයක් සිදු වී ඇති බවයි.

මෙම බේරුම්කරණයේ දී එය පිළිබඳ ව අවධානය යොමු කරමින් මෙම නඩුව දින 11 තිස්සේ පවත්වන ලද විභාගයන් හි දෙපාර්ශ්වය විසින් ම ඉදිරිපත් කරන ලද කරුණු සහ විභාග සටහන් මෙන්ම ලකුණු කරන ලද ලේඛන ද දෙපාර්ශ්වය විසින් ම ඉදිරිපත් කරන ලද පළමු හා අවසාන ලිඛිත දේශනයන් ද මාගේ අවධානයට යොමු විය.

ඇය සිය පළමු ප්‍රකාශයෙන් කියා සිටින්නේ මෙම ආයතනයේ සභාපතිගේ හා අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිගේ අදූරදර්ශී පරිපාලන හා කළමනාකරණ කාර්යය/ක්‍රමවේද හා ඔවුන්ගේ පෞද්ගලික අභිමතාර්ථයන් උදෙසා ඉල්ලුම්කාරියගේ රැකියාව අහිමි කළ බවයි. (පිටු අංක 14)

2024.01.17 අධිකරණයේ සාක්ෂි දෙමින් දෙවන පාර්ශ්වය කියා සිටින්නේ

ප්‍ර දැන් ඇය ආයතනයේ සේවයට පැමිණිලා මාස කීයකින් පස්සේ ද මෙසේ නිවාඩු ලබාගත්තේ

පි මාස 2 1/2, කින් පස්සේ දින 50 ක් පමණ නිවාඩු ගත්තා

ප්‍ර එකදිගටද දින 50ක් ගත්තේ

පි ඔව් (පිටු අංක 186)

2024.03.25 දින මෙම අධිකරණයේ දී පරිපාලන නිලධාරි වැඩබලන සහකාර අධ්‍යක්ෂ (පාලන) එම්. එල්. ආර්. ජයන්ත මහතා බේරුම්කරණයේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින්

ප්‍ර පරිවාස නිලධාරියෙකුට කොච්චර නිවාඩු හිමිද ?

පි පරිවාස නිලධාරියෙකුට පළමු වසර තුළ නිවාඩු 28 හිමි වෙනවා. විවේක 14 හිමිවෙන්නේ නැහැ. එය පළමු වසර තුළ අනියම් 7ක් සහ වෛද්‍ය 21 හිමි වෙනවා.

ප්‍ර ඒ වෛද්‍ය නිවාඩු 21 වැටුප් රහිතද? සහිතද?

පි වැටුප් රහිත නිවාඩු නෙවෙයි.

ප්‍ර ඒවා අඩු කරලද මේ හැටගාන අවේ.

පි නැහැ.

ප්‍ර වෛද්‍ය නිවාඩු 21ට වැටුප් ගෙවන්න ඕනැ. එකනේ වෛද්‍ය සහතික ඉදිරිපත් කරන්නේ

පි ඔව්.

ප්‍ර වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමේ පරමාර්ථය තමයි නිලධාරියාට පාලනය කර ගන්න බැරි තත්ත්වයත් තිබෙනවා කියලා. එකට අදාළ විශේෂඥ වෛද්‍යවරයෙක් හරි කවුරු හරි නිර්දේශයක් දෙනවා.

පි ඔව්.

ප්‍ර ඒක ආයතනයට ලැබුණාහම ආයතනය ඒක වැටුප් සහිත වශයෙන් සලකනවා

පි ඔව්.

ප්‍ර අර 21න් අඩු වෙනවා.

පි ඔව්.

ප්‍ර ඒ වරප්‍රසාදය මැයට දුන්නාද?

පි නැහැ.

2024.03.25 දින ඉල්ලුම්කාරියගෙන් දෙවන පාර්ශ්වයේ නීතිඥ රුවන් දයාසිංහ මහතා විසින් කරන ලද ප්‍රශ්න කිරීම් වලදී පහත සඳහන් කරුණු පිළිගෙන ඇත.

ප්‍ර මහත්මියගේ සේවා කාලය තුළ මහත්මිය කවදාවත් බගවන්තලාව සේවා කාර්යාලය පරීක්ෂා කරන්න ගියේ නැහැ.

පි ගියේ නැහැ.

ප්‍ර මහත්මියට මතකද 2018.12.31 වන දින මහත්මිය රාජකාරියට වාර්තා නොකළා නේද

පි වාර්තා කළේ නැහැ. (පිටු අංක 364)

2024.03.25 වන දින අධිකරණයේ දී දෙවන පාර්ශ්වයේ නීතිඥ මහතාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් ඇය කියා සිටියේ

පි	එතන ඉල්ලීමක් කරලා තිබෙන්නේ ඉවත්ව යන්න නෙවේ. මට තිබෙන චෝදනා වලින් විධිමත්ව මා නිදහස් කරන්න කියලා. ඊට පස්සේ මම වෙන ආයතනයකට යන්න අවස්ථාව සලසා ගන්නම් කියන එක තමයි අර්ථවත් වෙන්නේ.

ප්‍ර	මහත්මියට මම යෝජනා කරනවා R5 (අ) කොටසින් මේ රැකියාවෙන් ඉවත් වෙන්න ඉල්ලීමක් ආයතනයට කරලා තිබෙනවා කියලා.

පි	නැත. ස්වාමිනි. මම ප්‍රතික්ෂේප කරනවා. (පිටු අංක 367)

තවද 2018.08.01 අභ්‍යන්තර මැමය මගින් අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි විසින් ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ xii පරිච්ඡේදයේ 22.2 උප වගන්තය පරිදි උපයාගෙන ඇති නිවාඩු සියල්ල අවසන් වීමෙන් පසු 2018.06.12 වන දින සිට 2018 ජූලි 31 දක්වා වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බව ඉල්ලුම්කාරියට දන්වා ඇත. (ඇමුණුම් 04 පිටු අංක 116)

මෙම නිවාඩුව වෛද්‍ය නිර්දේශයන්ට අනුව දින 50ක් ඉල්ලුම්කාරිය ලබාගෙන ඇති අතර ඒ සඳහා මෙම අධිකරණය ලකුණු කරන ලද පැ.4 පැ.5 පැ.8 වෛද්‍ය සහතික ආයතනය වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කර ඇත. එම නිවාඩු විවේක නිවාඩු වශයෙන් සැලකේ. මීට පෙර ඇය විවේක නිවාඩු වෛද්‍ය නිර්දේශ මත ලබාගත් බවක් මෙම අධිකරණයේ දී ප්‍රකාශ නොවුණි. එසේ නම් ඇයට හිමි විවේක නිවාඩු 21ක් මෙම දින 50 තුළින් ආවරණය කිරීමට ආයතනයට හැකියාව තිබුණි. එබැවින් ඇය ලබාගත් විවේක නිවාඩු දින 50ම වැටුප් රහිත ලෙස තීරණය කිරීම නිවැරදි නොවේ.

**නිරීක්ෂණය හා නිගමනයන්**

මෙම අධිකරණයේ දී 2024.02.06 වන දින සාක්ෂි ලබාදෙමින් ප්‍රධාන විධායක නිලධාරී/ අධ්‍යක්ෂක ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා විසින් ආයතනයේ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ශ්‍රී ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහය උපයෝගී කර ගන්නා බව සඳහන් කරන ලදී.

ප්‍ර	ඔබ කියා සිටින්නේ ආයතනයේ පරිපාලනය හා නිලධාරී සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන මත කියලා

පි	ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන මත

ප්‍ර	ඒ කියන්නේ ආයතන සංග්‍රහයට අනුව කටයුතු කරනවා කියලා පාලක මණ්ඩලය දන්නවා.

පි	පාලක මණ්ඩලය දන්නවා (පිටු අංක 252)

මේ අනුව ඉල්ලුම්කාරියගේ පරිවාස කාලයට අදාළ කටයුතු කිරීමේ දී ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

2019.02.25 වන දින ඉල්ලුම්කාරියගේ පුද්ගලික ලිපිනයට ආයතනයේ සභාපති විසින් ලිපියක් යවා ඇති අතර 2019.03.25 දින සිට ඇය සේවයෙන් මුදා හැර සේවය සමාප්ත කළ බවත් එහිදී සේවයෙන් නිදහස් කරන ලෙසට ආර්. පී. අයි. එච්. රාජපක්ෂ යන අය විසින් කරන ලද ඉල්ලීමද සැලකිල්ලට ගත් බව සඳහන් කර ඇත. (ඇමුණුම 14)

ඉල්ලුම්කාරිය වන ආර්. පී. අයි. එච්. රාපක්ෂ මහත්මියගේ සැමියාද මෙම ගැටලුවට අදාළව මැදිහත් වී ඇති බව 2019.01.27 වන දින ඔහු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් අමතන ලද 2019.01.27 ලිපියෙන් නිරීක්ෂණය වේ. (පිටු අංක 464)

එම ලිපියේ 5 වන ඡේදයේ ඇගේ සැමියා විසින් සඳහන් කර ඇත්තේ තම භාර්යාවට මෙම රැකියාවෙන් නිදහස්ව ඉවත්ව යාමට මෙම ආයතනයේ අධ්‍යක්ෂකවරයාගෙන් ද, සභාපතිවරයාගෙන් ද ඉල්ලීම් කර ඇති බව සඳහන් කර ඇත.

ඔහු විසින් 2019.01.14 දාතමින් කාන්තා හා ළමා කටයුතු, වියළි කලාප සංවර්ධන කලාප අමාත්‍යාංශයේ ජාතික කමිටුවටද පැමිණිලි කර ඇත.

මෙම ඉල්ලුම්කාරිය වන ආර්. පී. අයි. එච්. රාජපක්ෂ මහත්මිය මෙම ආයතනයට 2018.03.21 වන දින සේවයට වාර්තා කිරීමෙන් පසු එදින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වන බව ඇයගේ පත්වීම් ලිපියේ සඳහන් කර ඇත. (R1B -පිටු අංක 770) පරිවාස කාලය තුළ ඇයගේ රාජකාරියට අදාළ මග පෙන්වීම ආයතනය විසින් සිදු කළ යුතු වේ. වීමෙන් ම අදාළ තනතුර සඳහා ඇය

කොතරම් දුරට යෝග්‍ය වේද යන්නත් නිරීක්ෂණය කිරීස හා රැකියාව ස්ථිර කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පරිවාසය කාලය උපයෝගි කර ගනු ලැබේ. මේ අනුව 2018.08.06 වන දින අභ්‍යන්තර කාර්ය සාධන සටහන අනුව පරිවාස කාලය තුළදී වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම ආයතනයේ පරිපාලන කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමට අපොහොසත් වීම/අකාර්යක්ෂම රාජකාරි කටයුතු යන විෂය යටතේ 2018.08.06 නිකුත් කළ අභ්‍යන්තර කාර්ය සාධන සටහන මගින් දින 90ක කාලයක් ලබා දෙමින් ඉල්ලුම්කාරියගේ සේවය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස, වගකීම් සහිතව ආයතනය වෙත ලබාදීමට කටයුතු කරන ලෙස තරයේ අවවාද කරමි යනුවෙන් සභාපති විසින් අධ්‍යක්ෂකට පිටපත් සහිතව ලිපියක් නිකුත් කර ඇත.

ආයතනයේ දී ඉල්ලුම්කාරියට ඇති වූ ගැටලු සම්බන්ධයෙන් 2019.03.12 වන දින 2019.05.06 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත ඇය විසින් සෘජුවම ලිපි යවා ඇත. පරිවාස කාලය ගත කරන යටත් නිලධරියෙකුගේ එවැනි ක්‍රියා කිසිසේත් අනුමත කළ නොහැක. (පිටු අංක 744,745,746)

එමෙන් ම පරිවාස කාල සීමාවේ පළමු වර්ෂයට අදාළව ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ඇයගේ රාජකාරි කටයුතු පිළිබඳව දුර්වලතා R8 සිට R8G දක්වා ලකුණු කළ ලේඛන මගින් කාර්මික අධිකරණයේ අවධානය යොමු කර ඇත.

### ප්‍රදානය

ඉහත කාරණා හේතුවෙන් කාර්මික නීතියේ ඉහළින්ම පිළිගැනෙන යුක්ති සහගත හා සාධාරණය නිගමනයන් වශයෙන් ඉල්ලුම්කාරියගේ ඉල්ලීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිගමනයට එළැඹි බව සඳහන් කරමි.

මෙම ඉල්ලුම්කාරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (පාලන) වශයෙන් අවුරුදු 03ක පරිවාස කාලසීමාවේ පසු වූ නිලධාරිනියක් වශයෙන් එම කාල සීමාවේ පළමු වර්ෂයට අදාළව එම ආයතනය විසින් ඇයට ලබාදුන් නියෝග සියල්ලම ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල බැවින් ඉල්ලුම්කාරිය විසින් කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ බවද සඳහන් කරමි.

**නිතීඥ ඒ. බී. හේරත්,**
බේරුම්කරු,

2024 මැයි මස 10 වැනි දින දී ය.
බේරුම්කරණය හා කාර්මික අධිකරණයේ දී ය.

EOG 07 - 0045

---

*මගේ අංකය*: IR/COM/04/2021/32.

### කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ 2022.11.19 දිනැති හා අංක 2306/86 දරන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන්, පිළියන්දල, සුවාරපොළ, බුද්ධාලෝක මාවත, අංක 8/28 හි පදිංචි එන්.ඕ.ඩී.ජී.එස්. පීරිස් මහතා සහ කොටුගොඩ, යාගොඩමුල්ල, අංක 122/4 හි පිහිටි මැක්රෝටෙක් හෙවි එන්ජිනියරින් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/81/2022 හා 2024.04.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.කේ.කේ.ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ).

2024 ජුනි මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ.

*නඩු අංකය:* A/81/2022.
*යොමු අංකය:* IR/COM/04/2021/32.

1. එන්.ඕ.ඩී.ජී.එස්. පීරිස් මයා,
අංක. 8/28,
බුද්ධාලෝක මාවත,
සුවාරපොළ,
පිළියන්දල.

*පළමු පාර්ශ්වය*

මැක්රෝටෙක් හෙවි එන්ජිනියරින්,
අංක 122/4,
යාගොඩමුල්ල,
කොටුගොඩ.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය, මනූෂ නානායක්කාර මහතා විසින් අංක 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බටුවත්ත, නාරංගොඩ පාළුව අංක. 501 පදිංචි නීතිඥ පාලිත සේනාධීර වන මා පත් කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

" එන්.ඕ.ඩී.ජී.එස්. පීරිස් මහතාට ලබා දෙන ලද නිල වාහනය හා ඉන්ධන දීමනාව අහිමි කිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

*පෙනී සිටීම :*

පළමුවන පාර්ශ්වය සිටී. පළමුවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සෞම්‍ය හෙට්ටිආරච්චි මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වය සිටී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ආර්.ජී.ගුණතිලක මහතා පෙනී සිටී.

*ආරාවුලේ පසුබිම :*

දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට ලබාදී තිබූ KU/8646 දරන වාහනය දෙවන පාර්ශ්වය විසින් නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් ද එකී වාහනය සඳහා ඉන්දන වියදම දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වයට ලබා නොදීම සම්බන්ධයෙන්ද සහ එකී අහිමි කරන ලද දීමනාව වන 2019.09.12 දින සිට 2020.12.26 දින දක්වා මාස 16ක කාලසීමාව සඳහා මසකට රුපියල් 80000.00 බැගින් වන්දි මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරු සිය ඉල්ලීම මගින් බේරුම්කරණයෙන් ආයාචනා කොට ඇත.

වගඋත්තරකරුගේ ස්ථාවරය වන්නේ ආයතනයේ ඇති ආර්ථික අපහසුතා හේතුවෙන් ඉල්ලුම්කරුගේ වාහනය යලි ආපසු ලබාගත් බවත් එකී ආර්ථික අපහසුතා මතම ඉන්ධන දීමනා අහිමි කරන ලද බවත් එය පුද්ගලික මට්ටමේ ආරාවුලක් නොවන බවත් කොවිඩ් 19 වසංගතය සමග ඇති වූ තත්ත්වය මත දෙවන පාර්ශ්වයට එසේ කිරීමට සිදුවූ බවයි.

**ප්‍රදානය ලබාදීමේදී හේතු වී ඇති කරුණු :**

පළමුවන පාර්ශ්වය විභාගය ආරම්භ කරන ලද අතර ඔහු විසින් A1 ලෙස ලේඛනයක් ලකුණු කරමින් කඩුවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ වගඋත්තරකාර ආයතනයට එරෙහිව කාර්මික නීතිය යටතේ සහන ලබාගැනීම සඳහා වූ නියෝගයක් ලකුණු කොට සාක්ෂි දෙන ලදී. තවද A2 යනුවෙන් ලකුණු කොට සාක්ෂි දී ඇත්තේ දෙවන පාර්ශ්වය පළමුවන පාර්ශ්වයට වාහනය ලබාදීමේදී පළමුවන පාර්ශ්වකරු වෙත එවන ලද ලිපියයි. එකී ලිපිය කොන්දේසි සහිතව දෙවන පාර්ශ්වය විසින් ලබාදෙන ලිපියකි. A3 යනුවෙන් දක්වා ඇත්තේ එකී වාහනය දෙවන පාර්ශ්වකරු විසින් පළමුවන පාර්ශ්වකරු වෙතින් ඉහත කී වාහනය යලි ලබා ගැනීම සම්බන්ධයෙන් හේතු දක්වන ලද ලිපියයි. A4 ලෙස දක්වා ඇත්තේ කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත කරන ලද පැමිණිල්ලයි. A5 ලෙස දක්වා ඇත්තේ එකී දෙවන පාර්ශ්වකරු විසින් පැමිණිලි පරීක්ෂණය හා සබැඳිව කම්කරු කොමසාරිස් වෙත නිකුත් කරන ලද ලිපියයි.

A6 ලෙස දැක්වෙන්නේ පළමුවන පාර්ශ්වකරු විසින් කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත යවන ලද වග උත්තරකරුගේ ලිඛිත සැලකිරීමයි. A7 ලෙස දක්වා ඇත්තේ පළමුවන පාර්ශ්වකරු වෙත විශ්‍රාම ගැන්වීමේ ලිපියයි. A8 ලෙස දැක්වෙන්නේ නැවතත් පළමුවන පාර්ශ්වකරු විසින් කම්කරු කොමසාරිස්වරයා වෙත යවන ලද ලිපියයි. A9 ලෙස පළමුවන පාර්ශ්වකරු ඉදිරිපත් කර ඇත්තේ ඔහුගේ වැටුප් විස්තරයයි. A10 ලෙස ලකුණු කොට ඇත්තේ අදාළ සියලු දීමනා සහිතව පළමුවන පාර්ශ්වය 2020 නොවැම්බර් මස ලබාගත් වැටුපයි. A11 ලෙස දක්වා ඇත්තේ සේවක අර්ථ සාධක අරමුදල් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා දෙවන පාර්ශ්වකාර ආයතනය වෙත යවන ලද අවවාදාත්මක ලිපියයි. A12 ලෙස ලකුණු කොට ඇත්තේ සේවා අර්ථ සාධක අරමුදලක් සමාජික සහතික පත්‍රයයි. තවද A13 සහ A14 යනුවෙන් EPF ආයතනයට දෙවන පාර්ශ්වකරු විසින් ලියන ලද ලද චෙක් පතද පළමුවන පාර්ශ්වකරුගේ හැඳුනුම්පතද ඉදිරිපත් කර ඇත.

දෙවන පාර්ශ්වකරු ද සිය ලේඛන ඉදිරිපත් කරමින් සාක්ෂි ලබාදී ඇත. R1 ලෙස දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇත්තේ පළමුවන පාර්ශ්වකරු කම්කරු කොමසාරිස්වරයා වෙත යවන ලද ලිපියයි. R2 ලෙස පළමුවන පාර්ශ්වකරුගේ වැටුප් විස්තරයද, R3 ලෙස පළමුවන පාර්ශ්වකරුගේ වැටුප් පත්‍රිකාව ද, R4 ලෙසට පළමුවන පාර්ශ්වකරුගේ වැටුප් පත්‍රිකාව ද, R5 ලෙස ලකුණු කොට ඇත්තේ සම්පත් බැංකුව සමග දෙවන පාර්ශ්වකාර ආයතනය ඇති කරගත් මූලය පහසුකමක් දැක්වෙන ලිපියද වේ. R6 ලෙස දක්වා ඇත්තේ දෙවන පාර්ශ්වයට එරෙහිව නුගේගොඩ දිසා අධිකරණයේ ඇති අංක 4487/21 දරන සිවිල් නඩුවක පිටපතක්ය. R7 ලෙස යලිත් එකී ලේඛනයම ලකුණු කොට ඇත. R8 ලෙස ලකුණු කොට ඇත්තේ ඒ. රත්නායක යන නීතිඥ මහතෙකු විසින් දෙවන පාර්ශ්වකරු වෙත එවා ඇති එන්තරවාසියයි. R9 ලෙස දක්වා ඇත්තේ සම්පත් බැංකුවේ චෙක්පත් නිෂ්කාශක දැනුම් දීමකි. R10 ලෙස පැහැර හරනු ලැබූ බදු වාර්තාවක් සම්බන්ධ ලේඛනයකි. R11 ලෙස චෙක්පත් අගුරුවීමේ ලේඛනයක් ලකුණු කොට ඇත. R11a ලෙස දක්වා ඇත්තේද චෙක්පත් අගුරුවීමේ ලේඛනයකි. R12 ලෙස දක්වා ඇත්තේ ද එවැනිම ලේඛනයකි. R13 ලෙස දක්වා ඇත්තේ වාහනයක අයිතිකාරත්වය සම්බන්ධ ලේඛනයකි. R14 ලෙස දක්වා ඇත්තේද වාහනයක් සම්බන්ධ ලේඛනයකි. R15, R16 යන ලේඛනද එවැනිම ලේඛන වේ. R17 ලෙස දක්වා ඇත්තේ පීපල්ස් ලීසින් සමාගම සමග කරන ලද ගනුදෙනුවක ලේඛනයකි. R18 ලෙස ඩේලි නිවුස් පුවත්පතේ ලේඛනයක් අමුණා ඇත.

මෙහි ඉහත සඳහන් පළමුවන පාර්ශ්වයේ සාක්ෂිද ඔහු විසින් ඉදිරිපත් කරන ලේඛනද දෙවන පාර්ශ්වකරුගේ සාක්ෂිද ඔහු විසින් ඉදිරිපත් කරන ලේඛනද මනා ලෙස විශ්ලේෂණය කොට සම්පින්ඩනය කොට සලකා බලන ලදී. මෙහිදී එන්.ඕ.ඩී.ජී.එස්. පීරිස් මහතා වෙත දෙවන පාර්ශ්වය විසින් ලබාදුන් නිල වාහනය හා ඉන්ධන දීමනාව අහිමි කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද යන්න විසඳිය යුතු ප්‍රධාන විසඳනාව වේ. එකී වාහනය සහ ඔහුට ලබා දුන් ඉන්ධන දීමනාව ලබාගැනීමට යුක්ති සහගත සහ සාධාරණ අයිතියක් තිබේද යන්න ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඔහුගේ මූලික සාක්ෂියෙන් සහ ලේඛනවලින් විමසා බැලිය යුතුව ඇත. ඔහු විසින් A1 දරන ලේඛනය ඉදිරිපත් කරමින් සාක්ෂි දී ඇති අතර එකි ලේඛනය ඔහු ඉල්ලන සහනය සම්බන්ධයෙන් ආවේශ නොවේ. A2 ලෙස දක්වා ඇත්තේ දෙවන පාර්ශ්වය විසින් පළමුවන පාර්ශ්වය වෙත වාහනය ලබාදීම සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපියයි. මෙකී ලිපියේ අන්තර්ගතය විග්‍රහ කිරීමේදී අර්ථය වන්නේ මේකී දීමනාව පළමුවන පාර්ශ්වය විසින් දෙවන පාර්ශ්වයට දෙනු ලබන ප්‍රසාද මට්ටමේ දීමනාවක් බවයි. A3 දරන ලිපියෙන් දක්වා ඇත්තේ එකී ප්‍රසාද මට්ටමේ දීමනාව නැවත පළමුවන පාර්ශ්වය වෙත හිමිකර දෙන ලෙසට කරන ලද ආයාචනයයි. A4 ලෙස දක්වා ඇත්තේ කොළඹ කම්කරු කොමසාරිස්වරයා වෙත කරන ලද පැමිණිල්ල වන අතර මෙකි ලේඛනයෙන් ප්‍රසාද හිමිකමක්ද නැද්ද යන්න ආවේශ කරගත හැකි සාක්ෂියක් නොවේ. A5 ලෙස දක්වා ඇති ලේඛනය ඉහත කී ආකාරයටම කම්කරු කොමසාරිස් වෙත නිකුත් කරන ලිපියයි. A6 සහ A8 ද ඉහතම ආකාරයේ ලිපියක් වේ. A7 ලෙස දක්වා ඇත්තේ විශ්‍රාම ගැන්වීමේ ලිපිය වන අතර එහිදී මෙම නඩුවේ නිමිත්ත ගැන අන්තර්ගතයක් දක්නට නොලැබේ. A9

සහ A10 ලෙස දක්වා ඇත්තේ වැටුප් සහ දීමනාවක් වන අතර එකී වාහනය හෝ ඉන්ධන දීමනාව ප්‍රසාද දීමනාවක් නොවන බවට ඔප්පු කිරීමට දෙවන පාර්ශ්වය සමත් වී නැත. A11, A12, A13 සහ A14 ලේඛන මෙම නඩු නිමිත්ත සමග සහසම්බන්ධ නොවේ.

දෙවන පාර්ශවකරුද R1 සිට R18 දක්වා ලේඛන සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් ඔවුන් විසින් ගරු අධිකරණය වෙත ඔප්පු කිරීමට උත්සහ කර ඇත්තේ මෙකී දීමනාව ගෙවීමට සූදානම් වුවත් ඔවුන් මුහුණ දි ඇති ව්‍යාපාරය බංකොලොත්වීමේ තත්ත්වය සහ ඔවුන්ගේ ණය බර අධික බවයි. එහිදී R5, R6, R7, R8, R9, R10, R11, R12, R13, R14, R15, R16 සහ R17 යන ලේඛනවලින් ගම්‍ය වන්නේ කොරෝනා වසංගතය සහ අනිකුත් ව්‍යාපාරික පවත්වාගෙන යාමේ දුෂ්කරතාවය මත අරමුදල් හීන වීම නිසා ව්‍යාපාරය බංකොලොත් වෙමින් පවතින බවයි. එකී බංකොලොත්භාවය මත තවදුරටත් පළමුවන පාර්ශ්වයට සපයන ලද ප්‍රසාද මට්ටමේ දීමනාව ගෙවා ගැනීමට වුවමනාව පැවතිය ද එකී දීමනාව ගෙවීමට නොහැකි තත්ත්වයක් උදාවි ඇති බවයි. මේ අනුව ඉල්ලුම්කරු විසින් ඉල්ලනු ලබන්නා වූ ලබාදෙන ලද නිල වාහනය හා ඉන්ධන දීමනාව ප්‍රසාද මට්ටමේ දීමනාවක් නොවන බවට ඔප්පු කිරීමට පළමුවන පාර්ශ්වය අසමත් වීමේ හේතුව මත මෙම ඉල්ලුම් පත්‍රය නිශ්ප්‍රභ කරමි.

මෙම ප්‍රදානය යුක්ති සහගත සාධාරන ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**නීතීඥ පාලිත සේනාධීර,**
බේරුම්කරු,

2024 අප්‍රේල් මස 08 වැනි දින.

EOG 07 - 0046